# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# බස්නාහිර පළාත් සභාව

නීතිය හා සාමය, මුදල් හා සැලසුම්, අධ්‍යාපන, නිවාස හා ඉදිකිරීම්,
රැකිරක්ෂා, පළාත් පරිපාලන, පළාත් පාලන හා
සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

## බස්නාහිර පළාත

## 1999 අංක 09 දරන බස්නාහිර පළාත් සභාවේ
## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරී ප්‍රඥප්තිය

බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සටහන් කළේ
2000.10.06 දින දී ය.

CM 3125

# බස්නාහිර පළාත

## අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය 1999 අංක 09 ප්‍රඥප්තිය

(සහතිකය සටහන් කළේ 2000 ඔක්තෝබර් මස 06 වැනි දින)

පළාතේ අපද්‍රව්‍ය එකතු කිරීම කළමනාකරණය කිරීම පිණිසත්. ප්‍රවාහනය කිරීම පිණිසත්, ඒවා මාරු කිරීම පිණිසත්, සකස් කිරීම හා අපහරණය පිණිසත්, බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරියක් පිහිටුවීම සඳහාත්, එහි කළමනාකරණය පිණිස ගිණුමක් ඇති කිරීම සඳහාත් සහ ඒ සම්බන්ධ හෝ ඊට අනුෂාංගික කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජාතික ප්‍රතිපත්ති රාමුව යටතේ කටයුතු කිරීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මෙම ප්‍රඥප්තිය බස්නාහිර පළාතේ 1999 අංක 09 දරන අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරි ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර ආණ්ඩුකාරවරයා විසින් අත්සන් තබන දිනයේ සිට එය ක්‍රියාත්මක වේ. *(ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය)*

### 1 වන කොටස

### බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය

2. බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (මෙහි මින්මතු "අධිකාරිය" වශයෙන් සඳහන් කරනු ලබන) නමින්, අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ. මෙම අධිකාරිය මෙහි පහත II වන කොටසේ විස්තර කර ඇති පරිදි ස්ථාපනය කරනු ලබන කළමනාකරණ මණ්ඩලයක් යටතේ පාලනය වනු ඇත. *(අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය පිහිටුවීම)*

3. මෙම අධිකාරිය මෙහි 2 වැනි වගන්තිය යටතේ එයට පවරා ඇති නාමය යටතේ සංස්ථාපිත මණ්ඩලයක් වන අතර, එයට අවිච්ින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් ඇත. තවද ඒ නාමයෙන් අධිකාරිය විසින් හෝ අධිකාරියට විරුද්ධ නඩු පැවරීමද කළ හැකිය. *(අධිකාරිය සංස්ථාගත මණ්ඩලයක් වීම)*

4. පළාත් සභාව විසින් වරින් වර අවශ්‍යයයි තීරණය කරන පරිදි, අධිකාරිය විසින් බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අධිකාරියේ ප්‍රතිපත්ති සහ ක්‍රියා පිළිවෙත් පැහැදිළි කරමින් පළාත් පාලන ආයතනයන්ට, මහජනයාට සහ මාධ්‍යයන්ට ප්‍රතිපත්ති ප්‍රකාශනයක් නිකුත් කරනු ලැබේ. පළමු වන ප්‍රතිපත්ති ප්‍රකාශනය අධිකාරිය සංස්ථාගත කිරීමෙන් දින 60 ඇතුළතදී නිකුත් කරනු ලැබේ. *(අධිකාරියේ ප්‍රතිපත්ති ප්‍රකාශන)*

5. අධිකාරියේ අරමුණු පහත දැක්වෙන පරිදි වේ. *(අධිකාරියේ අරමුණු)*

(අ) මෙම ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්ම කිරීම.

(ආ) පළාතේ මහජනයාගේ මෙන්ම සතුන් හා වෘක්ෂලතා ආදියේද යහපත සඳහා පළාතේ නාගරික සහ ග්‍රාමීය ප්‍රදේශවල පරිසරය පිරිසිදුව තබා ගැනීම.

(ඇ) (i) පළාතේ පළාත් පාලන ආයතන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය, අන්තරායකර අපද්‍රව්‍ය, සායනික හෝ අසාදන අපද්‍රව්‍ය පරිහරණය වෙනුවෙන් අපද්‍රව්‍ය කළමනාකරණ රෙගුලාසි පැනවීම. මෙම රෙගුලාසි අධිකාරිය සමඟ ගනුදෙනු කරන අයට අදාල වේ. මෙසේ පනවනු ලබන රෙගුලාසි පළාත් පාලන ආයතනවල ක්‍රියාකාරකම්වලට බලපෑමක් ඇති කරන්නේ නම් එම රෙගුලාසි පැනවීමේදී අදාළ පළාත් පාලන ආයතනවල එකඟත්වය ලබා ගැනීමට අධිකාරිය කටයුතු කරනු ඇත.

(ii) පළාතේ පළාත් පාලන බල ප්‍රදේශවල ඝන අපද්‍රව්‍ය, සායනික හෝ ආසාදන අපද්‍රව්‍ය පරිහරණය වෙනුවෙන් පළාත් පාලන ආයතන වල සහයෝගය ඇතිව අපද්‍රව්‍ය කළමනාකරණ මාර්ගෝපදේශ හඳුන්වා දීම. මෙම මාර්ගෝපදේශ පළාතේ සීමාවන් තුළ සියළු වර්ගවල අපද්‍රව්‍ය උත්පාදනය කරන්නා වූ හෝ පරිහරණය කරන්නා වූ පළාත් පාලන ආයතන, වෙනත් ආයතන හෝ කොන්ත්‍රාත්කරුවන් විසින් පිළිපැදිය හැකිය.

(ඈ) පළාත් පාලන ආයතනයන්ට ඔවුන්ගේ සියළුම වර්ගවල (නාගරික, අන්තරායකාරී සහ සායනික හෝ ආසාදන) අපද්‍රව්‍ය එකතු කිරීම, ප්‍රවාහනය, සකස් කිරීම හා බැහැර කරලීම් කළමනාකරණය සහ පාලනය සඳහා සහාය වීම.

(ඉ) පළාත තුළ අපද්‍රව්‍ය මාරු ඒකක, අපහරණ පහසුකම් හෝ අපද්‍රව්‍ය වෙනත් නිෂ්පාදනයන්ට යොදා ගැනීමේ හෝ සකස් කිරීමේ පහසුකම් ස්ථානගත කිරීම, සැලසුම් කිරීම, ඉදිකිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ පහසුකම් අධිකාරිය විසින් සැපයීම සහ කළමනාකරණය කිරීම.

(ඊ) සුදුසු අවස්ථාවන්හිදී පළාත් පාලන ආයතනයන්ට සහ අනිකුත් අදාල ආයතනයන්ට ඔවුන්ගේ අපද්‍රව්‍ය පරිහරණය සඳහා අවශ්‍ය තාක්ෂණික ඥානය ලබාදීමද, අපද්‍රව්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයේ නියැලෙන කළමනාකරුවන්ට සහ ක්‍රියාකාරින්ට අපද්‍රව්‍ය කළමනාකරණ තාක්ෂණ දැනුම ලබාදීමට සංවිධානය කිරීම හා පළාතේ මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

(උ) පළාතේ සියළු පළාත් පාලන ආයතනයන් සඳහා අපද්‍රව්‍ය කළමනාකරණ දත්තගත කිරීමේ හා වාර්තා කිරීමේ පද්ධතියක් පවත්වාගෙන යාම.

(ඌ) වර්තමාන ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ ගැටළු සහ කරුණු අධ්‍යයනය කිරීම, අධිකාරිය හා අදාළ පළාත් පාලන ආයතන එකඟතාවයකට පැමිණි ක්‍රමෝපායක් මගින් සීමිත කාලීන ක්‍රියාකාරී සැලසුම් මගින් එම ගැටළු විසඳීමට සැලසුම් සකස් කිරීම.

(එ) සම්පතක් වශයෙන් අපද්‍රව්‍ය පරිහරණය කිරීමේ හැකියාවන් විමර්ශනය කර බැලීම, අපද්‍රව්‍ය තේරීම, නැවත පරිහරණයට ගැනීම, ප්‍රතිචක්‍රීකරණය ප්‍රවර්ධනය කිරීම, අපද්‍රව්‍ය වෙනත් නිෂ්පාදන සහ අතුරු නිෂ්පාදන සඳහා යොදා ගැනීම ප්‍රවර්ධනය කිරීම සහ ඊට සුදුසු පර්යේෂණ සහ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීම.

(ඒ) සනීපාරක්ෂක ලෙසින් කසළ බිම් පිරවීම, අපද්‍රව්‍ය අවම කිරීම, අපද්‍රව්‍යවල අඩංගු ප්‍රයෝජනවත් ද්‍රව්‍ය වෙන්කර ගැනීම, ප්‍රතිචක්‍රීකරණය, කොම්පෝස්ට් නිපදවීම, ඉන්ධන නිපදවීම, දහනය සහ අනිකුත් තාක්ෂණ ක්‍රම ආදියෙන් අපද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම සම්බන්ධයෙන් බස්නාහිර පළාතට කාර්යක්ෂම සහ සුදුසු යයි අධිකාරියට හැඟීයන තාක්ෂණ ක්‍රම පළාතේ ක්‍රියාත්මක කිරීමට අධ්‍යයනය කිරීම හා ප්‍රවර්ධනය කිරීම.

(ඔ) පළාත තුළ දේශීය හෝ විදේශීය මුදල් ආධාර සහිතව අධිකාරිය හෝ වෙනත් අය විසින් ක්‍රියාත්මක කරනු ලබන සියළුම ව්‍යාපෘති පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සමඟින් සම්බන්ධීකරණය කිරීම සහ අධීක්ෂණය කිරීම.

(ඕ) මෙම ප්‍රඥප්තියේ පරමාර්ථයන්ට අදාල වෙනත් ඕනෑම කාර්යයක යෙදීම.

(ක) පළාත් සභාවේ අදහසට අනුව අධිකාරිය විසින් අවශ්‍ය යයි සලකනු ලබන ඊට අදාළ වෙනත් කාර්යයන්හි නියැලීම.

අධිකාරියේ බලතල

6. පහත සඳහන් කාර්යයන් සඳහා අධිකාරියට බලය තිබේ.

(අ) තත් කාලයෙහි බලපවත්නා යම් ලිඛිත නීතිවලට යටත්ව චංචල හෝ නිශ්චල දේපළ අයත් කර ගැනීම, භුක්ති විඳීම, බද්දට හෝ කුලියට දීම හෝ උකස් හෝ වෙනත් අයුරකින් බැහැර කරලීමටද, (මෙම දේපළක් පළාත් පාලන ආයතනයක් සතුව පවතින අවස්ථාවක ඒ සම්බන්ධයෙන් අධිකාරිය කටයුතු කළ යුත්තේ අදාළ පළාත් පාලන ආයතනයේ එකඟත්වය ඇතිවය).

(ආ) අදාළ නීති විධිවිධානයන් ප්‍රකාරව අධිකාරියේ ඕනෑම පරමාර්ථයක් ඉදිරියට ගෙන යෑම සඳහා කොන්ත්‍රාත්වලට හෝ ඒකාබද්ධ ගිවිසුම්වලට ඇතුළත් වීමටද,

(ඇ) අධිකාරිය විසින් සපයනු ලබන පහසුකම් සඳහා ගාස්තු අයකිරීමටද,

(ඈ) අවශ්‍ය කාර්ය මණ්ඩල පත්කිරීම, සේවයෙහි යෙදවීම, වැටුප් ගෙවීම සහ ඔවුන්ගේ විනයානුකූල පාලනය පවත්වාගෙන යාම සහ ඒ කාර්යය සඳහා අවශ්‍ය නීති සහ රෙගුලාසි සැකසීම හා ක්‍රියාත්මක කිරීමටද,

(ඉ) කාර්ය මණ්ඩලයේ සාමාජිකයින්ට විශේෂිත රාජකාරී වෙන්කර දීම හා ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයීම සහ අවශ්‍ය අවස්ථාවන්හි ප්‍රතිකර්ම පියවර ගැනීමට ද,

(ඊ) අධිකාරියේ ඉහත සඳහන් පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය යන්ත්‍රෝපකරණ, උපකරණ සහ වාහන ආනයනය කිරීම හෝ වෙනත් අයුරකින් ලබා ගැනීමටද,

(උ) අදාල වන පළාත් පාලන ආයතනවල එකඟත්වය ඇතිව බස්නාහිර පළාත් සභාව යටතේ ඇති පළාත් පාලන ආයතනවල අපද්‍රව්‍ය කළමනාකරණයට අදාල තීරණ ගැනීමටද,

(ඌ) අධිකාරිය සුදුසු යයි සලකනු ලබන ක්‍රම මගින් මෙම ව්‍යවස්ථාව යටතේ පනවනු ලබන රෙගුලාසි ක්‍රියාත්මක කිරීමටද,

(එ) රජයේ දෙපාර්තමේන්තු, අමාත්‍යාංශ, වෙනත් පළාත් සභා, මධ්‍යම පරිසර අධිකාරියද ඇතුළු ව්‍යවස්ථාපිත මණ්ඩල සමඟ අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ අරමුදල්, තාක්ෂණය, විශේෂඥ ඥානය සහ එයට අදාල වෙනත් කරුණු සම්බන්ධයෙන් ගිවිසුම්වලට ඇතුළුවීම හා එවැනි ගිවිසුම් ක්‍රියාත්මක කිරීමට ද,

(ඒ) දැනට පවත්නා නීතිය යටතේ පළාත් සභාවට බලය පවරා ඇති ප්‍රමාණයට අරමුදල්, තාක්ෂණය, විශේෂඥ ඥානය හෝ වෙනත් ආධාර ලබා ගැනීම පිණිස විදේශ ආයතන සමඟ සාකච්ඡා කිරීම සහ එවැනි ඉල්ලීම් අදාළ රජයේ ආයතන මගින් සිදු කිරීමට ද,

(ඔ) අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් වූ නීති හා රෙගුලාසි උල්ලංඝනය කිරීම පිළිබඳව මහජනයා, පළාත් පාලන ආයතන හෝ වෙනත් ඕනෑම ආයතනයක් මගින් කෙරෙන පැමිණිලි පරීක්ෂා කිරීම හා ඒ සම්බන්ධව සුදුසු පියවර ගැනීමට ද,

(ඕ) පළාත් පාලන ආයතන වලින් හෝ පළාත් සභා දෙපාර්තමේන්තුවකින් හෝ ආයතනයකින් යම් නියමිත කාල පරිච්ඡේද තුළදී හෝ යම් විශේෂිත අවස්ථාවක හෝ යම් නියමිත කරුණක් සම්බන්ධයෙන් වාර්තා ලබා ගැනීමට ; සහ

(ක) ඉහත 5 (ඉ) යටතේ විස්තර කර ඇති කාර්යයන් පළාත් පාලන ආයතනයන්ට හෝ වෙනත් ආයතනයකට/ආයතනවලට සුදුසු පරිදි පවරා දීමට ද වේ

## II වන කොටස

### අධිකාරියේ පාලක මණ්ඩලය

7\. (1) අධිකාරිය වෙනුවෙන් ක්‍රියා කිරීම හා එහි කටයුතු පාලනය කිරීම සඳහා නිලබලයෙන් සාමාජිකයින් වන හත්දෙනෙකුගෙන් හා පත්කරනු ලබන සාමාජිකයින් අටදෙනෙකුගෙන් යුතු (මෙහි මින්මතු 'මණ්ඩලය' යනුවෙන් හඳුන්වනු ලබන) පාලක මණ්ඩලයක් තිබිය යුතුය. පාලක මණ්ඩලය

(2) පහත සඳහන් අය මණ්ඩලයට නිලබලයෙන් පත් වන සාමාජිකයන් වන්නේය :-

(අ) බස්නාහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්,

(ආ) පළාත් පාලන කටයුතු පවරා ඇති අමාත්‍යාංශයේ ලේකම්,

(ඇ) බස්නාහිර පළාත් සභාවේ පාරිසරික කටයුතු භාර අමාත්‍යාංශයෙන් නම් කරනු ලබන නියෝජිතයෙක්,

(ඈ) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් (ඉංජිනේරු) හෝ අධ්‍යක්ෂ (ඉංජිනේරු),

(ඉ) බස්නාහිර පළාත් සභාවේ නියෝජ්‍ය ලේකම් (සැලසුම්) හෝ අධ්‍යක්ෂ (සැලසුම්),

(ඊ) පළාත් පාලන කොමසාරිස්,

(උ) පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හෝ ඔහු විසින් නම් කරනු ලබන ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයකු.

(3) ප්‍රධාන ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ඇමතිවරයා විසින් නම් කරනු ලබන, පත්කළ සාමාජිකයින් (මෙහි මින්මතු 'පත්කළ සාමාජිකයින්' වශයෙන් හඳුන්වනු ලබන) අටදෙනා පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතුය :-

(අ) පළාතේ මහ නගර සභාවලින් නියෝජිතයින් දෙදෙනෙකුද, නගර සභාවලින් නියෝජිතයින් දෙදෙනෙකුද, ප්‍රාදේශීය සභාවලින් නියෝජිතයින් දෙදෙනෙකුද, (මහ නගර සභා නියෝජිතයින් දෙදෙනාගෙන් එක් අයකුවත් කොළඹ මහ නගර සභාවෙන් විය යුතුය),

(ආ) අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ කටයුතුවල ක්‍රියාත්මකව සම්බන්ධවන ප්‍රජා සංවිධානවල නියෝජිතයෙක් සහ

(ඇ) අපද්‍රව්‍ය කළමනාකරණ කටයුතුවල නියුක්තව සිටින සහ එම ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් හා අත්දැකීම් ඇති අයෙක්ද, වේ.

(4) අපද්‍රව්‍ය කළමනාකරණ විෂය භාර පළාත් සභා ඇමතිවරයාගේ එකඟත්වය ඇතිව ප්‍රධාන ඇමතිවරයා විසින් මණ්ඩලයේ එක් සාමාජිකයෙකු එහි සභාපති වශයෙන් පත්කළ යුතුය.

(5) පළාත් පාලන කොමසාරිස් මණ්ඩලයේ ලේකම් විය යුතුය.

පත්කළ සාමාජිකයෙකුගේ නිල කාලය නැවත පත් කිරීම සඳහා සාමාජිකයින්ගේ සුදුසුකම් සාමාජිකයින්ගේ ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නුසුදුසුකම්

8. (1) ඉල්ලා අස්වීමෙන්, මරණයෙන්, ඉවත් කිරීමෙන් හෝ වෙනත් අයුරකින් නිලකාලයට පෙර ඉවත් නොවුවහොත්, පත්කළ සාමාජිකයෙක් අවුරුදු තුනක කාලයක් සඳහා එම තනතුර දරණු ඇත.

(2) කාලසීමා නියමයන් අනුව තනතුරු අත්හරින පත්කළ සාමාජිකයෙකු, නැවත පත්වීම සඳහා සුදුසු වන්නේය.

(3) ඇමතිතුමා වෙත යවනු ලබන ලිපියක් මගින් පත්කළ සාමාජිකයෙකුට සිය තනතුරෙන් ඉල්ලා අස්විය හැකිය.

(4) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයෙකු, මණ්ඩලයේ සාමාජිකයෙකු වීමට හෝ පත්කළ සාමාජිකයෙකු වශයෙන් සිටීමට සුදුසු නොවන්නේය.

වැඩබලන සාමාජිකයින් පත් කිරීම

9. (1) රෝගාතුරවීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් කරුණක් හේතු කොට ගෙන සිය රාජකාරි කටයුතුවල නියැලීමට තාවකාලිකව අපොහොසත් වන්නා වූ ඕනෑම සාමාජිකයෙකු වෙනුවෙන් 08 වැනි වගන්තියට යටත්ව, ඒ වෙනුවට කටයුතු කිරීමට වෙනත් අයෙකු සාමාජිකයෙකු වශයෙන් ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(2) (1) වැනි වගන්තියේ දක්වා ඇති හේතු නිසා සභාපතිවරයා සිය තනතුරෙහි රාජකාරි ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක, ඔහු නොමැති කාලය සඳහා සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමට මණ්ඩලයේ වෙනත් සාමාජිකයෙකු ඇමතිවරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

මණ්ඩලයේ රැස්වීම ගණපූරණය

10. මණ්ඩලය අඩු තරමින් මසකට වරක්වත් රැස්විය යුතුය.

11. මණ්ඩලයේ ඕනෑම රැස්වීමක් සඳහා ගණපූරණය පස් දෙනෙකු විය යුතුය.

මණ්ඩලයේ රැස්වීම්වලදී ක්‍රියා පිළිවෙල

12. ප්‍රඥප්තියේ වෙනත් විධිවිධානයන්ට යටත්ව රෙගුලාසි මගින් රැස්වීම් හා වෙනත් අදාල කරුණු සම්බන්ධයෙන් සිය ක්‍රියා පිළිවෙල මණ්ඩලයට සකස් කර ගත හැකිය.

මණ්ඩලයේ අඩුපාඩු හේතුකොට ගෙන කිසියම් කාර්යයක් අවිධිය අවලංගු නොවිය යුතුවීම

13. මණ්ඩලයේ පවත්නා වූ පුරප්පාඩුවක් හෝ මණ්ඩලයට සාමාජිකයෙකු පත් කිරීමේ අඩුපාඩුවක් හේතුකොටගෙන මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ තීරණයක් අවලංගු සේ නොසැලකිය යුතුය.

පාරිශ්‍රමික ගෙවීම

14. ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි පාරිශ්‍රමික මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවිය යුතුය.

අධිකාරියේ පොදු මුද්‍රාව

15. (1) අධිකාරියේ පොදු මුද්‍රාව මණ්ඩලයේ ලේකම්වරයා භාරයේ තිබිය යුතුය.

(2) අධිකාරිය විසින් තීරණය කරන්නා වූ පිළිවෙලට එහි මුද්‍රාව සැකසීම හෝ වෙනස් කිරීම කළ හැකිය.

(3) මණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනෙකු ඉදිරියේ මිස යම් ලියවිල්ලක් හෝ ලේඛණයක් සඳහා අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, එසේ පැමිණ සිටින්නා වූ සාමාජිකයින් දෙදෙනා ඔවුන්ගේ පැමිණීමේ සංකේතයක් වශයෙන් එම ලියවිල්ල හෝ ලේඛණයේ අත්සන් තැබිය යුතුය.

(4) අධිකාරියේ මුද්‍රාව තැබූ ලේඛණ හෝ ලියවිලි පිළිබඳ ලේඛණයක් මණ්ඩලය විසින් පවත්වා ගත යුතුය.

16. මෙම ප්‍රඥප්තියේ හෝ ඒ යටතේ, මණ්ඩලයට සෘජුවම නියම කර පවරා ඇති බලතල, කාර්යයන් සහ රාජකාරි ක්‍රියාත්මක කිරීමට අමතරව, ප්‍රඥප්තියේ 05 වගන්තියේ හෝ එහි වෙනත් ඕනෑම විධිවිධානයක් යටතේ සඳහන් කර ඇති යම් බලයන් හෝ සියළුම බලතල ක්‍රියාත්මක කිරීමට මණ්ඩලයට බලය ඇත. මණ්ඩලයේ බලතල

17. මණ්ඩලයේ කාර්යයන් පහත දැක්වෙන පරිදි විය යුතුය :-- මණ්ඩලයේ කාර්යය

(අ) අධිකාරියේ පරමාර්ථවල අදහස් කර ඇති සේවා හැකිතාක් දුරට පහත දැක්වෙන අයගේ යහපත සඳහා ක්‍රියාත්මක කිරීම :-

1. පළාත් සභාව හෝ පළාත් සභාවේ යම් අමාත්‍යාංශයක් ; හෝ

2. අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම පිණිස අධිකාරිය යටතේ පිහිටුවා ඇති යම් ආයතනයක් ; හෝ

3. සිය අදාළ කර්තව්‍ය වන අපද්‍රව්‍ය කළමනාකරණයේ යෙදී ඇති යම් පළාත් පාලන ආයතනයක්,

(ආ) එහි පරමාර්ථ සපුරා ගැනීම පිණිස අවශ්‍ය වන්නා වූ එවැනි සියළුම පියවර ගැනීම ;

(ඇ) තමන්ගේම අදහස අනුව හෝ ඇමතිතුමාගේ ඉල්ලීම මත අපද්‍රව්‍ය එක්රැස් කිරීම, ප්‍රවාහනය, සකස් කිරීම සහ බැහැරලීමට අදාළ සියළු කරුණු සම්බන්ධයෙන් ඔහුට උපදෙස් දීම.

18. (1) මණ්ඩලය සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන් මණ්ඩලයේ යම් සාමාජිකයෙකු හෝ එහි සේවකයෙකු වෙත පවරනු ලැබිය හැක.

(2) එසේ බලතල, කර්තව්‍ය හා කාර්යයන් පවරා දී ඇත්තේ යම් සාමාජිකයෙකුට හෝ සේවකයෙකුටද, ඒ යම් සාමාජිකයා හෝ සේවකයා විසින් ඒවා මණ්ඩලයේ සාමාන්‍ය හෝ විශේෂ විධානයන්ට යටත්ව ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම කළ යුතුය. මණ්ඩලයේ බලතල කර්තව්‍ය හා කාර්යයන් පැවරීම

19. (1) මණ්ඩලය සිය බලතල කර්තව්‍ය හා කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී ඇමතිවරයා විසින් වරින් වර නිකුත් කරනු ලබන සාමාන්‍ය හා විශේෂ විධිවිධානයන්ට යටත්ව ක්‍රියාත්මක කළ යුතුය. මණ්ඩලයට ඇමතිවරයා විසින් කරනු ලබන විධිවිධාන

(2) ඇමතිවරයා විසින් වෙනත් යම් ඇමතිවරයෙකුගේ කාර්යයකට අදාළ වන්නා වූ යම් කරුණක් සම්බන්ධයෙන් (1) උපවගන්තිය යටතේ විධානයක් කිරීමේදී එසේ කළයුතු වන්නේ අදාළ ඇමතිවරයා විමසීමෙන් පසුව වේ.

20. මෙම ප්‍රඥප්තියේ අනිකුත් විධිවිධානයන්ට යටත්ව, මණ්ඩලය විසින්

(අ) තීරණය කරන්නා වූ පාරිශ්‍රමික හා වෙනත් කොන්දේසි මත අධිකාරියේ ප්‍රධාන විධායකයා විය යුතු සුදුසු තැනැත්තෙකු, පූර්ණ කාලීනව අධිකාරියේ අධ්‍යක්ෂ වශයෙන් පත්කිරීමද,

(ආ) අධිකාරියේ කාර්ය මණ්ඩලය පත්කිරීම, සේවයෙන් පහකිරීම හා ඔවුන් විෂයයෙහි විනයානුකූල පරිපාලනය පවත්වා ගැනිමද, මණ්ඩලයේ බලතල

(ඇ) එවැනි කාර්ය මණ්ඩලයක් වෙනුවෙන් වේතන හෝ වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නිශ්චය කිරීමද,

(ඈ) එකී කාර්ය මණ්ඩලයන්ගේ සේවා නියමයන් හා කොන්දේසි නිශ්චය කිරීම සහ

(ඉ) එකී කාර්ය මණ්ඩලයන්ගේ යහපත සඳහා අර්ථසාධක අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් පිහිටුවීම, ක්‍රියාත්මක කිරීම සහ එවැනි අරමුදලක් හෝ යෝජනා ක්‍රමයක් සඳහා දායක මුදල් ගෙවීමද කළ හැකිය.

## III වන කොටස

## මුදල් සහ ගිණුම්

අපද්‍රව්‍ය ගිණුම

21. (1) පහත දැක්වෙන මුදල්වලින් සමන්විත මෙහි මින්මතු "අපද්‍රව්‍ය ගිණුම" යනුවෙන් සඳහන් කරනු ලබන "අපද්‍රව්‍ය කළමනාකරණ ගිණුම" යනුවෙන් හැඳින්වෙන්නා වූ ගිණුමක් පළාත් සභා අරමුදලේ ක්‍රියාත්මක කර පවත්වාගෙන යා යුතුය.

(අ) එයට පළාත් සභාව විසින් වෙන් කරනු ලබන්නා වූ අරමුදල්,

(ආ) ඇමතිවරයාගේ විධාන යටතේ පළාත් පාලන ආයතන විසින් ප්‍රදානය කරනු ලබන අරමුදල්,

(ඇ) අධිකාරිය විසින් සපයනු ලබන්නා වූ සේවා සඳහා ලැබෙන ආදායම්,

(ඈ) ශ්‍රී ලංකා රජයේ අනුමැතිය ඇතිව අධිකාරියට ලැබෙන්නා වූ සියළුම ණය මුදල් සහ විදේශාධාර; සහ

(ඉ) සිය කටයුතුවලින් ලැබෙන්නා වූ වෙනත් යම් ආදායම්.

(2) 1987 අංක 42 දරන පළාත් සභා පනතේ පළාත් සභා අරමුදලට අදාල III පරිච්ඡේදයෙහි විධිවිධානයන්ට යටත්ව අපද්‍රව්‍ය ගිණුම පවත්වාගෙන යාම හා ක්‍රියාත්මක කිරීම.

(3) (4) උප වගන්තියෙහි සඳහන් කාර්යයන් සඳහා වරින් වර මණ්ඩලයට අවශ්‍ය වන්නා වූ සියළුම මුදල් ප්‍රමාණයන් පළාත් සභා අරමුදලින් අපද්‍රව්‍ය කළමනාකරණ ගිණුමට මාරු කළ යුතුය.

(4) අධිකාරිය සමග කොන්ත්‍රාත්තුවලට එළඹ ඇති ආයතයන්ට කරනු ලබන ගෙවීම් ද ඇතුළුව, මෙම ව්‍යවස්ථාව යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීම හෝ කර්තව්‍යයන් හා කාර්යයන් ඉටු කිරීමේදී මණ්ඩලයට දැරීමට වන්නා වූ යම් වැයක් දැරීම සඳහා අවශ්‍ය වන්නා වූ සියළුම මුදල් අපද්‍රව්‍ය කළමනාකරණ ගිණුමෙන් ගෙවිය යුතුය.

22. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂයක් විය යුතුය.

අධිකාරියේ මුදල් වර්ෂය. අධිකාරියේ ගිණුම් විගණනය කිරීම

23. (1) එක් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් වූ ගිණුම් එම මුදල් වර්ෂය අවසන්ව මාස හයක් ගතවීමට පෙර විගණනය සඳහා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එකී ගිණුම් විගණනය කිරීමේ කාර්යයන් සඳහා විගණකාධිපතිවරයා විසින් තමාට සහයවීම සඳහා තමාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියාකරන්නා වූ සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරුන් සේවයෙහි යොදවා ගත හැකිය.

(2) අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයාට වැය වන මුදල් පියවීම සඳහා ඇමතිවරයා විසින් තීරණය කරනු ලබන යම් පාරිශ්‍රමයක්, අධිකාරියේ අරමුදලින් විගණකාධිපතිවරයාට ගෙවිය යුතුය. එවැනි විගණන කාර්යයන් සඳහා විගණකාධිපතිවරයා විසින් සේවයේ යොදවා ගන්නා සුදුසුකම් ඇති විගණන නිලධාරියෙකුට ගෙවනු ලබන මුදල් අඩු කිරීමෙන පසු ලැබෙන පාරිශ්‍රමික මුදල් ශ්‍රී ලංකා ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතුය.

(3) අධිකාරියේ ගිණුම් විගණනය කරනු ලබන විගණකාධිපතිවරයාට හෝ ඔහුට සහාය වන යම් පුද්ගලයෙකුට එම කාර්යය සඳහා අවශ්‍ය පොත්පත්, ඔප්පු, කොන්ත්‍රාත්, ලියකියවිලි ගිණුම්, වවුචර සහ විගණකාධිපතිවරයා විසින් අවශ්‍යයයි අදහස් කරන අනිකුත් ලියකියවිලිද එම කාර්ය සඳහා අවශ්‍ය තොරතුරු ඔවුන්ගේ දැනීමේ තරමට මණ්ඩලය හෝ එහි නිලධාරින් විසින් සැපයිය යුතුය.

(4) මෙම වගන්තියේ කාර්යය සඳහා ''සුදුසුකම් ලත් විගණක'' යන යෙදුමෙන් අදහස් කරනුයේ,

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ හෝ නීතයෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයක සාමාජිකයෙකු වන බව සභාවෙන් හෝ එකී ආයතනයෙන් ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියේ නිරතවීම් සඳහා සහතිකයක් ලබා ඇති පුද්ගලයෙකු හෝ,

(ආ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයෙන් හෝ වෙනත් නීතියෙන් ස්ථාපිත වෙනත් යම් ආයතනයකින් ගණකාධිකාරිවරයෙකු ලෙස වෘත්තියේ නිරතවීම සඳහා එකී ආයතනයෙන් නිකුත් කර ඇති සහතිකයක් දරන්නා වූ ගණකාධිකාරිවරුන් හෝ ගණකාධිකාරි ව්‍යාපාරයක් ද වේ.

24. (1) විගණකාධිපතිවරයා විසින් අධිකාරියේ ගිණුම් පරීක්ෂා කර වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය. විගණකාධිපති වාර්තාව

(අ) ඔහු සියළු තොරතුරු හෝ අවශ්‍ය විස්තර ලබාගත් බව හෝ ලබා නොගත් බව එහි දැක්විය යුතුය.

(ආ) අධිකාරියේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ මතයක් විදහා දැක්වෙන අන්දමින් වාර්තාවේ සඳහන් කර ඇති ගිණුම් නිසිලෙසින් සකස් කර ඇතිද යන්න සඳහන් කිරීම ; සහ

(ඇ) ඔහුගේ අදහසට අනුව ගිණුම්වල යම් විෂයයක් පළාත් සභාවට වැදගත් වේ නම් ඒ සම්බන්ධව එහි අවධානය යොමු කිරීම හා අධිකාරියේ එවැනි කටයුතු සහ ගිණුම් පරීක්ෂා කිරීම හා

(2) විගණනය කරන ලද ගිණුම් ද සමග විගණකාධිපති සිය වාර්තාව අධිකාරියේ මුදල් අධ්‍යක්ෂ වෙත යැවිය යුතුය.

25 සෑම වසරකම විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාව ලැබුණ පසු අධිකාරියේ අධ්‍යක්ෂ විසින් විගණකාධිපතිගේ වාර්තාව සහ කටයුතු සම්බන්ධව වාර්ෂික වාර්තාව අධිකාරියේ කටයුතු සම්බන්ධ වාර්තාවක්ද සහිතව එම ගිණුම් ප්‍රධාන ඇමතිවරයා වෙත යැවිය යුතු අතර, ඔහු අධිකාරියේ ගිණුම් අදාළ මුදල් වර්ෂය අවසාන වී දොළොස් මසක් ඇතුළත දී එහි පිටපත් පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය.

## IV වන කොටස

### පොදු

26. (1) මෙම ප්‍රඥප්තිය යටතේ වූ ප්‍රතිපත්ති හා විධිවිධාන ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ද, මේ ව්‍යවස්ථාව යටතේ නියම කර හෝ සඳහන් කර ඇති සියළුම හෝ අවශ්‍ය වන්නා වූ කරුණු ද ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රෙගුලාසි සැකසීමේ කාර්යය ඇමතිවරයා විසින් කළ හැකිය. රෙගුලාසි

(2) ඇමතිවරයා විසින් සාදනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළ කළයුතු අතර ගැසට් පත්‍රයේ පළකළ දින හෝ එහි සඳහන් කර ඇති අන්දමට වෙනත් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය.

(3) ඇමතිවරයා විසින් පනවනු ලබන සෑම රෙගුලාසියක්ම ගැසට් පත්‍රයේ පළකිරීමෙන් අනතුරුව පහසු ඉක්මන් අන්දමට අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එවැනි යම් රෙගුලාසියක් පළාත් සභාව විසින් අනුමත නොකරන්නේ නම් ඒ යටතේ පෙරාතුව කරන ලද යම් කාර්යයකට හානියක් නොවන අන්දමින්, අනුමත නොකළ දින සිට අවලංගු වූවාසේ සලකනු ලැබිය හැකිය. ඇමතිවරයා විසින් පනවනු ලැබූ රෙගුලාසි අවලංගු වූවා සේ සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීමද ගැසට් පත්‍රයේ පළකළ යුතුය.

(4) වරින් වර සංශෝධනය කරනු ලැබූ 1980 අංක 47 දරන ජාතික පරිසර පනත යටතේ පනවා ඇති පරිසර ලපසායන් පිළිබඳ නියෝග සහ ඒ යටතේ පනවා ඇති වෙනත් යම් නියෝග බස්නාහිර පළාතේ අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය විසින් සකස් කරනු ලැබ, බස්නාහිර පළාත් සභාව විසින් පනවනු ලැබූ අපද්‍රව්‍ය නියෝග මගින් උල්ලංඝනය නොකෙරෙන අතර, ඒ මගින් එවා තවදුරටත විකාශනය කෙරේ. කෙසේ වෙතත් ආයතන දෙක මගින් පනවනු ලැබූ නියෝග සම්බන්ධයෙන් යම් මතභේදයක් පැන නැගුනහොත් අංක 47 දරන ජාතික පරිසර සනත යටතේ වූ අර්ථ නිරූපන අදාල විය යුතුය.

(5) බස්නාහිර පළාත් සභාව විසින් පනවනු ලැබ ඇති අපද්‍රව්‍ය හෝ පාරිසරික දූෂකයන් පිළිබඳව ක්‍රියාකරන අපද්‍රව්‍ය පිළිබඳව වූ යම් නියෝග ශ්‍රී ලංකා ජනරජයද පාර්ශවයක් වන යම් ජාත්‍යන්තර සම්මුතියක්, ජාත්‍යන්තර ගිවිසුමක් හෝ එකඟතාවයක් යටතේ වූ ශ්‍රී ලංකා ජනරජයේ යම් අයිතියකට හෝ බැඳීමකට පරස්පර විරෝධී නොවිය යුතු අතර, ඒවා උල්ලංඝනයද නොකළ යුතුය.

මෙම ව්‍යවස්ථා යටතේ ඉඩම් අත්පත් කර ගැනීම

27. (1) මෙම ව්‍යවස්ථාව යටතේ යම් කාර්යයක් සඳහා පළාතේ පිහිටි යම් ඉඩමක් අවශ්‍ය බැව් ඇමතිවරයා අදහස් කරන විටදී ඇමතිවරයාගේ නිර්දේශය මත පළාත් සභාවේ රැස්වීමකදී පහත දැක්වෙන පරිදි යෝජනා සම්මත කරනු ලැබිය හැකිය.

(අ) ඉඩම රජයේ ඉඩමක් වන්නේ නම්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය යටතේ වූ නව වැනි උපලේඛනයේ ලැයිස්තු, අංක 01 සිට 11 පරිශිෂ්ඨයේ 1.2 විෂය යටතේ වූ කාර්යයක් සඳහා එකී ඉඩම අධිකාරියට ලබා දෙන ලෙස අයදුම් කළ හැකිය.

(ආ) ඉඩම පෞද්ගලික ඉඩමක් වන්නේ නම් ඉඩම් විෂය භාර කැබිනට් ඇමතිවරයාට එය ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ වූ කාර්යයක් සඳහා අධිකාරිය වෙනුවෙන් එය අත්පත් කර ගැනීමට අයදුම් කළ හැකිය.

(2) 1 වැනි උප වගන්තිය යටතේ යෝජනාවක් බස්නාහිර පළාත් සභාව විසින් සම්මත කර ඇතිවිටදී ඒ පිළිබඳ අයදුම්පතක් නියමිත ආකෘති පත්‍රයේ,

(අ) යෝජනාව රජයේ ඉඩමකට අදාළ වන්නේ නම් අදාළ අධිකාරියට ; හෝ

(ආ) යෝජනාව පෞද්ගලික ඉඩමකට අදාළ වන්නේ නම්, අධිකාරියට එම ඉඩම එකී කාර්යය සඳහා ලබාදෙන ලෙස ඉල්ලමින් කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය භාර කැබිනට් ඇමතිවරයාට ද යොමු කළ හැක.

(3) 2 වැනි උප වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රය මත අදාළ අධිකාරිය හෝ ඉඩම් විෂය භාර කැබිනට් මණ්ඩලයේ ඇමතිවරයා හෝ අදාල වන පරිදි, එකී ඉඩම පළාත් සභාවට ලබාදුන් විට අදාළ අධිකාරිය යම් පනතකින්, ආඥාපනතක්, අදාළ අධිකාරියේ හෝ කැබිනට් මණ්ඩලයේ ඉඩම් විෂය ඇමතිවරයා විසින් නියම කර ඇති අන්දමට වන්දි ගෙවීම, කොන්දේසි හෝ නියමයන්ට යටත්ව අදාළ අධිකාරිය විසින් එකී ඉඩම එම කාර්යයට හැර වෙනත් කාර්යයකට පාවිච්චි නොකළ යුතුය.

පොදු සංස්ථාව සමාගම් ආදිය සමඟ ගිවිසුම්

28. මෙම ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක සඳහන් විධිවිධානයන්ට යටත්ව, මෙම ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි යම් පොදු සංස්ථාවක්, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයක් සමඟ කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වී ඒවා ඉටු කිරීම හා ක්‍රියාත්මක කිරීම කළ හැකිය.

මණ්ඩලයේ සේවකයන් රාජ්‍ය සේවකයන් වශයෙන් සැලකිය යුතු බව

29. අධිකාරියේ සියළුම නිලධාරීන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්යයන් සඳහා රාජ්‍ය සේවකයින් වශයෙන් සලකනු ලැබිය යුතුය.

රහස්‍යභාවය ආරක්ෂා කිරීම

30. අධිකාරියේ නිලධාරියෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු සිය රාජකාරි හෝ කාර්යයන් ඉටු කිරීම හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා ඇමතිවරයාට හෝ යම් නීතියක් යටතේ අධිකරණයකින් නියම කර ඇති විටදී හැර, මෙම ප්‍රඥප්තිය යටතේ තම කාර්යයන් ඉටු කිරීම හෝ ක්‍රියාත්මක කිරීමේදී හෝ තමන්ගේ බලතල ක්‍රියාත්මක කිරීමේදී ලබාගන්නා ලද යම් තොරතුරක් වෙනත් පුද්ගලයෙකුට හෙළි නොකළ යුතුය.

මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය යටතේ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව

31. (1) (අ) මෙම ප්‍රඥප්තිය යටතේ මණ්ඩලය විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයට විරුද්ධවද,

(ආ) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත මණ්ඩලයේ යම් නිලධාරියෙකු, සේවකයෙකු හෝ නියෝජිතයෙකු විසින් සද්භාවයෙන් කරනු ලබන හෝ කරන ලද්දේ යයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් මණ්ඩලයේ යම් නිලධාරියෙකුට විරුද්ධවද, අධිකරණය ඉදිරියේ නඩු නොපැවරිය යුතුය.

(2) 1 වන උප වගන්තියේ සඳහන් එකී යම් පුද්ගලයෙකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක් ඉදිරියේ පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවකදී එකී ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් යයි අධිකරණය තීරණය කරන්නේ නම් ඔහු විසින් දරන ලද වියදම් අපද්‍රව්‍ය කළමනාකරණ ගිණුමෙන් ගෙවනු ලැබිය යුත්තේය.

32. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි "සමාගම" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති සමාගමක් අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"අන්තරායකාරී අපද්‍රව්‍ය" යන්නෙන් නුසුදුසු අන්දමින් කළමනාකරණය කළහොත් මානව සෞඛ්‍යයට සැහෙන ලෙසින් අන්තරායකාරී විය හැකි පරිදි සමාජය විසින් කරන නිෂ්පාදන හා අතිකුත් කටයුතුවලදී ඇතිකරන්නා වූ අපද්‍රව්‍ය අදහස් කෙරේ. ඒවායෙහි පහත දැක්වෙන ලක්ෂණයන්ගෙන් එකක් හෝ ඇත. (ගිනිගන්නා සුළුබව, මළකඩකෑම, ප්‍රතික්‍රියාව හෝ විෂ සහිත භාවය).

"පළාත් පාලන ආයතනය" යන්නෙන් පළාත තුළ ක්‍රියාත්මක වන අදාල ආඥාපනත් සහ/හෝ පනත් යටතේ පිහිටුවා ඇති මහ නගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් ද අදහස් කෙරේ.

"ඇමතිවරයා" යන්නෙන් පළාත් ඇමති මණ්ඩලයේ අපද්‍රව්‍ය කළමනාකරණ විෂයභාර ඇමතිවරයා අදහස් කෙරේ.

"අමාත්‍යාංශය" යන්නෙන් පළාත් සභාවේ පළාත් පාලන අමාත්‍යාංශය අදහස් කෙරේ.

"නාගරික ඝන අපද්‍රව්‍ය" යන්නෙන් පවත්නා නීති යටතේ පළාත් පාලන ආයතන විසින් එකතු කර බැහැර කළ යුතු පදිංචි නිවෙස්, වෙළඳ හා වාණිජ ආයතන, ආයතනවල ඇතිවන්නා වූ අපද්‍රව්‍ය ද අන්තරායකාරී නොවන කාර්මික, කෘෂිකාර්මික, කසළ කාණු මඩ, මාර්ගවල අතුගාන කුණු හා ඉදිකිරීම් අපද්‍රව්‍ය ද අදහස් කෙරේ.

"පළාත" යන්නෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රිවාදී සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාත ද අදහස් කෙරේ.

"පළාත් සභාව" යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාව ද අදහස් කෙරේ.

"පොදු සංස්ථා" යන්නෙන් රජය විසින් ප්‍රදාන, ණය හෝ වෙනත් අන්දමින් ලැබෙන අරමුදල් හෝ ප්‍රාග්ධනය සපයා ඇති, 1982 අංක 17 දරන සමාගම් පනත හැර වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පිහිටවූ හෝ පිහිටුවා ඇති සංස්ථා, මණ්ඩල හෝ වෙනත් සමාගම් අදහස් කෙරේ.

"ඝන අපද්‍රව්‍ය" යන්නෙන් නිවාස, වාණිජ ආයතන, වෙනත් ආයතන හෝ කර්මාන්තමය ප්‍රභවයන්ගෙන් ඇතිවන්නා වූ ඝන ද්‍රව්‍ය අඩංගු නාගරික අපද්‍රව්‍ය අදහස් කෙරේ.

33. මේ පනතේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.